සුවෙන් පෙරට

e ඉගෙනුම් පියස

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
Zonal Education Office - Minuwangoda

වාරය - දෙවන වාරය

| | | |
|---|---|---|
| ශ්‍රේණිය : 10 | විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 10 වන පාඩම පුවත්පත් විශේෂාංග ලිපි |

පුවත්පතක පළවන විවිධ දේවල් පිළිබඳ සටහනක් පහත දැක්වේ..




**පාඩමේ ඇතුළත් අධ්‍යයනය කළ යුතු පද / යෙදුම් :-**

- විශේෂාංග ලිපි - විශේෂ තේමා/ මාතෘකා යටතේ රචනය කරන ලිපි
- මාධ්‍ය ආචාරධර්ම - මාධ්‍ය සඳහා පනවා ඇති යහපත් පැවතුම් / සදාචාර කරුණු
- අපූර්වත්වයකින් - අපූරු බවකින්/ පෙර නොවූ අයුරකින්
- සෑම පාර්ශවයක්ම - සියලු කොටසක්ම/ සෑම පැත්තක් ම
- ප්‍රස්තුතය - මුල් වූ කරුණ/ අදාළ කරුණ/ මාතෘකාව
- කනපින්දම - කොඳුරමින් කරන ඇවිටිල්ල/ඉල්ලීම/කනිපින්දම
- හෘදයංගම ව - ළෙන්ගතුව
- සංක්ෂිප්තව - ලුහුඬු ලෙස /සාරාංශගතව
- අඩෝ ලිපි - ලේඛනයක යටින් දැක්වෙන කොටස / විශේෂ සටහනක් ආදිය යටින් කළ ලියමන

## විශේෂාංග ලිපියක මූලික ලක්ෂණ: -

- ලිපියක ප්‍රවෘත්තියක් හෝ වෙනත් මූලාශ්‍රයක් පදනම් කරගෙන සම්පාදනය කළ හැකිය.
- පාඨකයා ප්‍රිය කරන මාතෘකාවක් නොව පාඨකයාට වැදගත් වන මාතෘකාවක් විය යුතුය .
- මහජන සුබසිද්ධිය සඳහා වන මාධ්‍ය ආචාර ධර්ම සුරක්ෂිත විය යුතුය.
- මූලාශ්‍රයට අදාළ සෑම පැතිකඩක්ම ආවරණය විය යුතු ය.
- නිර්මාණාත්මක විය යුතු ය.
- අන්තර්ගතය සමබරවීම අත්‍යවශ්‍ය වේ.
- ලිපිය මගින් පෞද්ගලික අදහස් හා මතවාද ඉදිරිපත් නොකළ යුතුය .
- **තොරතුරු ,දත්ත හා කරුණු මගින් පාඨකයාට නව දැනුම සම්ප්‍රේෂණය කළ යුතු ය.**
- **අදාළ කරුණු සම්බන්ධ ව සමාජ සංවාදයකට ඉඩ සලස්වන්නක් විය යුතු ය.**
- **අදාළ මාතෘකාව පිළිබඳව ගැඹුරු අවබෝධයක් පාඨකයාට ලැබිය යුතුය.**

### විශේෂාංග ලිපි වර්ග කිහිපයකි.

01.පුද්ගල චරිත වටා ගෙතුණු විශේෂාංග ලිපි

යම් ප්‍රසිද්ධ පුද්ගලයෙකුගේ චරිතය ආශ්‍රයෙන් ලියැවෙන විශේෂාංග ලිපි ය.
උදා : “අප්‍රිකානු සිංහයා ලොවෙන් සමුගනී ”

02 . චාරිකා ඇසුරෙන් ලියැවෙන විශේෂාංග ලිපි

දේශීය හා විදේශීය වශයෙන් විවිධ සුන්දර ස්ථානවල සංචාරය කොට එම සංචාරය පිළිබඳව වර්ණනාත්මක ව ලියනු ලබන විශේෂාංග ලිපිය
උදා : “ නෙත් සිත් බැඳ ගන්නා පේරාදෙණිය රාජකීය උද්‍යානය ”

03.යම් නිර්මාණයක් ඇසුරෙන් ලියැවුණු විශේෂාංග ලිපිය

විවිධ සාහිත්‍ය කලා නිර්මාණ පිළිබඳව වර්ණනාත්මකව මුඛයෙන් ලියනු ලබන ලිපි මේ ගණයට අයත් වේ. උදා : “ළමා ලොවේ සදාකාලික මිතුරා අඹ යහළුවෝ ”

04.විද්‍යාත්මක තොරතුරු ඇසුරෙන් ලියැවෙන විශේෂාංග ලිපි

විවිධ විද්‍යාත්මක පර්යේෂණ සහ ගවේෂණ මගින් අනාවරණය කරගත් තොරතුරු ආශ්‍රයෙන් ලියනු ලබන විශේෂාංග ලිපි
උදා: “කොවිඩ් මර්දනය කිරීම උදෙසා එන්නත්වල වැදගත්කම ”

05. විචාර විශේෂාංග ලිපි

සාහිත්‍ය කලා නිර්මාණ පිළිබඳව ලියනු ලබන විචාරාත්මක ලිපි මේ ගණයට අයත් වේ.
උදා : “හැම අත්දැකීමක් ම නිර්මාණ රචකයෙකුට වැදගත් ”

06. දරුවන්ගේ කුතුහලය දනවන විශේෂාංග ලිපි

පාසල් දරුවන් කියවීමට වඩාත් යෝග්‍ය වන ඔවුන්ගේ කුතුහලය අවුස්සනසුලු නිර්මාණාත්මක ලිපි මේ ගණයට අයත් වේ.
උදා : “ කුහුඹු ලොවේ රස තොරතුරු ”

විශේෂාංග ලිපි නිර්මාණය කිරීමේදී අවධානයට යොමු කළ යුතු කරුණු :-

- භාෂාව සරලව යොදා ගත යුතු ය.
- ලියනු ලබන ප්‍රවෘත්තිය රසවත් ලෙස ඉදිරිපත් කළ යුතු ය.
- ආකර්ෂණීය ආරම්භයක් තිබිය යුතු ය.
- සමස්ත ප්‍රවෘත්තියේ ම සාරාංශයක් සහිත අවසානයක් තිබිය යුතු ය.
- පාඨකයාගේ හදවතට දැනෙන ලෙස ඉදිරිපත් කළ යුතු ය.
- අදාළ සිද්ධියේ සෑම පැත්තක් ම විවරණය වී තිබිය යුතු ය.
- අනවශ්‍ය විස්තර ඇතුළත් නොකළ යුතුය.
- සංක්ෂිප්තව කරුණු ඉදිරිපත් කළ යුතුය.
- සදාචාරාත්මක බව ආරක්ෂා කළ යුතුය .
- ප්‍රස්තාර, සංඛ්‍යාලේඛන ඇතුළත් නොකළ යුතු ය.
- අපහාසාත්මක දේ ඇතුළත් නොකළ යුතු ය
- සත්‍ය කරුණු පමණක් ඇතුළත් කළ යුතු ය.
- අධිකරණය හමුවේ පවතින දෑ ලිවීමේදී බොහෝ පරිස්සම් විය යුතු ය.
- මාතෘකාව හෙවත් ශීර්ෂපාඨ ය සිත් ඇදගන්නා **සුලු එකක් විය යුතු ය.**

ස්වයං ඉගෙනුම් අභ්‍යාස

- ඔබ පුවත්පතක් සපයාගෙන ඉහත ආකෘතිය අනුව පුවත්පතක අන්තර් දේවල් එක් එක් ශීර්ෂ යටතේ සොයාගෙන අභ්‍යාස පොතේ ( මාතෘකාව ලියා) කපා අලවන්න.

- **පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

1. විශේෂාංග ලිපියක් යනු කුමක් ද ?
2. පුවත්පතක අන්තර්ගත දේවල් 5 ක් ලියන්න.
3. විශේෂාංග ලිපියක් ලිවීම සඳහා යොදාගත හැකි මූලාශ්‍ර 3 ක් ලියන්න.
4. විශේෂාංග ලිපි නිර්මාණය කළ හැකි ක්ෂේත්‍ර 6 ක් ලියන්න.
5. විශේෂාංග ලිපි රචනා කිරීමේදී අවධානයට ලක්විය යුතු කරුණු 5 ක් ලියන්න.

- පහත සඳහන් සිද්ධි හා වාර්තා පදනම් කරගෙන විශේෂාංග ලිපි ලියන්න.

01. 10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඉෂාර සම්පත්ගේ ගමට තවම විදුලිය නැත. ඉෂාරගේ නිවසට අසලින් දොළපාර හරස්කර කුඩා විදුලි බලාගාරයක් තැනීමට ඉෂාරට සිතක් පහළ විය. ඔහු ඒ පිළිබඳව තොරතුරු වැඩිදුර හදාරා වැඩිහිටියන්ගේ සහාය ද ඇතිව කුඩා විදුලි බලාගාරයක් ඉදි කළේ ය. එයින් ගමට ම විදුලිය ලැබුණි. ගම්වැසියෝ ඉෂාරට පින් දෙමින් විදුලිය භාවිත කරති.

02. ඔබ විසින් නරඹන ලද සුන්දර ස්ථානයක් පිළිබඳව චාරිකා විස්තරයක් සහිතව විශේෂාංග ලිපියක් ලියන්න.